Uva Wellassa University

# ලංසු සඳහා ආරාධනය

# ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය

## ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා විභාග ශාලා සංකීර්ණය ඉදිකිරීම

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින් ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා විභාග ශාලා සංකීර්ණය ඉදිකිරීම සඳහා යෝග්‍ය සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවයි .කොන්ත්‍රාත් කාලය **මාස 7කි.**

ජාතික තරඟකාරී ලංසු තැබීමේ පටිපාටිය හරහා ලංසු කැඳවනු ලැබේ.

කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරු අසාදු ලේඛනගත කර නොතිබිය යුතු අතර ගොඩනැගිලි ඉදිකිරීමේ විශේෂිත වූ ගොඩනැගිලි වල CIDA C4 හෝ ඊට ඉහල ලියාපදිංචිය සපුරාලිය යුතුය.

ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කළ හැකි අතර **2025 ඔක්තෝබර් 19 දින සිට 2025 නොවැම්බර් 10** දින දක්වා පෙ.ව .9.00 සිට ප .ව.3.00 දක්වා ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී ප්‍රාග්ධන වැඩ අංශය වෙත ලිඛිත / අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්හෝ www.uwu.ac.lk විශ්ව විද්‍යාලීය වෙබ් පිටුව මගින් උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කරනලද ලංසු ලේඛන කට්ටලයක් ආපසු නොගෙවන **රු.30,000.00ක** ගාස්තුවක් විශ්ව විද්‍යාලයේ සරප්වෙත ගෙවීමෙන් හෝ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සඳහා ලංකා බැංකුවේ ගිණුම් අංක 3114820 වෙත මුදල් තැන්පත් කිරීමෙන් මිලදී ගත හැකිය .

සියලුම ලංසු වලට ලංසු සුරැකුමක් තිබිය යුතුය . ලංසු සුරැකුම **රු.1,520,000.00 කි**. මෙය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද වාණිජ බැංකුවකින් ලබා ගන්නා "කොන්දේසි රහිත" බැංකු ඇපකරයක් සමඟින් තිබිය යුතුය .මෙම ලංසු සුරැකුම **2026 මාර්තු 11** දින දක්වා වලංගු විය යුතුය.

නිසි පරිදි සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ලංසු ලේඛන එහි අනුපිටපතක් සමඟ **2025 නොවැම්බර් 11** වැනි දින **ප.ව.2.00** ට පෙර සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර හෝ ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. ප්‍රමාද වූ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ ප්‍රාග්ධන අංශය වෙතින් වැඩිදුර තොරතුරු ලබා ගත හැක) .දුරකතන : 055-3050847.ෆැක්ස් : 055-2226633

ලංසු **2026 පෙබරවාරි 11** වන දින දක්වා වලංගු විය යුතුය.

ලංසු විවෘත කිරීම **2025 නොවැම්බර් 11** වන දින ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ සනාතන මණ්ඩල **ශාලාවේදී ප.ව . 2.00**ට ලංසුකරු හෝ ලංසුකරුගේ නියෝජිතයින් ඉදිරියේදී සිදු කෙරේ.

පූර්ව ලංසු රැස්වීමක් **2025 ඔක්තෝබර් 30** වන දින **පෙ.ව.10.00** ට ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ නඩත්තු කාර්යාලයේදී පවත්වනු ලබන අතර, ලංසුකරුවන්ට ව්‍යාපෘති අවශ්‍යතා පිළිබඳ පැහැදිලි කිරීම් ඉල්ලා සිටිය හැකිය එමෙන්ම . ඉදිකිරීම යෝජිත ස්ථානය නැරඹීමට කටයුතු සංවිධානය කරනු ලැබේ.
පූර්ව ලංසු රැස්වීමේ මිනිත්තු සහ අතිරේකය සහ වෙනත් දැන්වීම් තිබේ නම්, ඒවා විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ පළකරනු ලැබේ. එබැවින්, ලංසු විවෘත වන තෙක් ලංසුකරුවන් එය අනුගමනය කල යුතුය.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය
2025 ඔක්තෝබර් 16